b) ලංසුකරුගේ ප්‍රකාශය

c) ලංසු සුරක්ෂණය ( මුදලින් ගෙවන්නේ නම් අදාල මුදල පේරාදෙණිය ශික්ෂණ රෝහලේ සරප් අංශය වෙත ගෙවා කුවිතාන්සියේ මුල් පිටපත ඉදිරිපත් කර තිබිය යුතුය)

d) පිරිසිදු කිරීමේ සේවාව ඉටුකිරීම සඳහා ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය (සහතික කළ පිටපතක්) (ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම් ආඥා පනත හෝ 2007 අංක 07 දරණ සමාගම් පණත යටතේ පිරිසිදු කිරීමේ සේවය සැපයීමේ ආයතනයක් ලෙස ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය.)

e) රාජ්‍ය, අර්ධරාජ්‍ය ආයතනයක හෝ පෞද්ගලික රෝහලක අවම වසරක පළපුරුද්ද පිලිබඳ අදාළ ආයතන සමඟ එළඹී ගිවිසුම් (සහතික කළ පිටපත්) (දැනට ඉදිරිපත් කරන සේවක සංඛ්‍යාවෙන් අවම වශයෙන් 25%ක්වත් පෙර ආයතනයක සේවයේ යොදවා ඇති බවට තහවුරු කළ යුතුය)

f) සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල සඳහා ලංසු අයදුම් පතෙහි අංක 14හි සඳහන් සේවක සංඛ්‍යාව සඳහා කොපමණ සේවක සංඛ්‍යාවකට කොපමණ මුදලක් ගෙවා ඇත්ද යන බවට ශ්‍රී ලංකා මහ බැංකුවෙන්/සේවක භාරකාර අරමුදලෙන්, පසුගිය වසර 03 තුළ මාස 12කට අදාල ගෙවීම් සහතිකයන්හි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කල යුතුය.

g) වරලත් විගණන ආයතනයකින්, ආයතනයේ විගණනය කරන ලද වාර්ෂික ගිණුම් ප්‍රකාශන (2023/2024 වර්ෂයට අදාළව) සහ ලංසු දැන්වීමෙහි සඳහන් පරිදි මසකට අවමය හෝ ඊට වැඩි වන පරිදි කොන්දේසි රහිත බැංකු අයිරා පහසුකම් ලබාදෙන බවට කොන්ත්‍රාත්කරු ගනුදෙනු කරන බැංකුවෙන් නිකුත් කළ ලිපියක් (මුල් පිටපත) (ලංසු විවෘත කිරීමේ දිනයට පෙර මසක් ඇතුළත ලබාගත් සහතිකයක් විය යුතුය.)

h) පොදු කොන්ත්‍රාත් පනතේ 08 වැනි වගන්තිය යටතේ වන ලියාපදිංචි සහතිකය (මුල් පිටපත)

i) අවශ්‍යතා උපලේඛනයේ (IV කොටස) සඳහන් පිරිසිදු කිරීමේ සේවය සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය නිසි ප්‍රමිතියකින් යුක්ත විය යුතුය. එම ද්‍රව්‍ය සඳහා ITI ආයතනය මඟින් ලබා ගත් සහතිකය ඉදිරිපත් කළ යුතුය.තවද අඩංගු රසායනික ද්‍රව්‍ය (Ingredients) හා ප්‍රමාණ අදාළ ඇසුරුමෙහි විධිමත් පරිදි සඳහන් කළ යුතුය. ඒ ඒ ද්‍රව්‍ය වලට අදාළව තත්කාලීනව පවත්නා වෙළඳපොළ මිළ ගණන් නොඉක්මවිය යුතුය.

තවද, ඉහත ඉදිරිපත් කරන ලද සහතිකවලට අනුකූලව ආයතනය වෙත පිරිසිදු කිරීමේ සේවය සැපයීමේ දී නියමිත ප්‍රමිතියට අනුව පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍ය සපයනු ලබන බවට ලංසුකරු විසින් වග විය යුතුය. ඒ පිළිබඳව ආයතනය විසින් අධීක්ෂණය කරනු ලබයි. ලංසු ලියවිලි සමඟ ඉදිරිපත් කරනු ලබන තත්ත්ව සහතික, මුද්‍රා තබන ලද ඇසුරුම්වල පිටපත් වරින් වර ආයතනයේ බලයලත් නිලධාරියකු විසින් ප්‍රමිතිය හා ඇසුරුම අධීක්ෂණය කරනු ලබයි.

j) **තත්කාලීනව බලපවත්නා වූ සියලුම නීතිරීතිවලට අනුකූලව (පඩිපාලක සහා වැටුප්, අයවැය සහන දීමනා, අතිකාල, සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල) කටයුතු කරන ආයතනයක් බවට** මාස 06ක් ඇතුළත ආයතනය ලියාපදිංචි ප්‍රදේශය භාර සහකාර කම්කරු කොමසාරිස් වෙතින් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

k) ලංසු ඉදිරිපත් කිරීමේ දී රජයට අනුබද්ධ ආයතන හැර අනෙකුත් ආයතන ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද මාස 06ක් දක්වා වලංගු රු. 300,000.00 ක වත්කම් සහතිකයක්.

l) සක්‍රියව ආදායම් බදු ගෙවන බවට සනාථ කිරීමට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ තම ආයතනය නමින් ප්‍රේෂණය කරන ලද පූර්ව වර්ෂයේ ප්‍රේෂණ පිටපත් ඉදිරිපත් කළ යුතුය.